**ශ්‍රී ලංකා රග්බි සංගමය - 2024**
**----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා රග්බි සංගමයේ (“සංගමය”) 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවාස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සහ 1993 අංක 47 දරන ක්‍රීඩා (සංශෝධන) පනතේ 9 වන වගන්තියෙන් සංශෝධිත 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 21.අ වගන්තියේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර,බසංගමයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේවූ මාගේ වගකීම, විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාන අස්ථිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී , සංගමය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර ,කළමනාකාරිත්වය සංගමය ඈවර කිරීමට අදහස් කරන්නේනම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංගමයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංගමයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංගමයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි සංගමයේ ආදායම, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බැවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- සංගමයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංගමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සංගමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංගමයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර

තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංගමයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංගමය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සහ
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SMEs සඳහා SLFRS) අනුකූල නොවීම.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කුඩා සහ මධ්‍ය පරිමාණ අස්තිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 17:19 වගන්තිය ප්‍රකාරව වත්කමක ප්‍රයෝජනවත් ජීවිත කාලය හෝ අවශේෂ අගය ඉතාම ආසන්නතම වාර්ෂික වාර්තාකරණ දිනයට වෙනස් වී ඇති බවට ඇඟවීම් පවතින්නේ නම්, එය වාර්ෂිකව සමාලෝචනය කර ඒ අනුව ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතුය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා රග්බි රු.1,867,949 ක් වටිනා සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් සම්බන්ධයෙන් එවැනි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මෙය 2025 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | සංගමය කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්වයන් සඳහා වූ ප්‍රමිතියට අනුකූල විය යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ශ්‍රී ලංකා රග්බි වෙත ප්‍රදානය කරන ලද රු.8,775,000 ක මුදලක් මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2025 වර්ෂයේදී මේ සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ | සියලුම ප්‍රදාන මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 සංගමයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් වන විට ශ්‍රී ලංකා රග්බි හි මුළු ජංගම වගකීම් එහි මුළු ජංගම වත්කම් රු.28,203,944 කින් ඉක්මවා තිබුණු අතර මුළු වගකීම් එහි මුළු වත්කම් රු.27,495,339 කින් ඉක්මවා තිබුණි. තවද, සමුච්චිත අරමුදලේ ඍණ ශේෂය මුළු වත්කම්වලින් 1.6 ගුණයක් විය. මෙම තත්ත්වය ශ්‍රී ලංකා රග්බි හි අඛණ්ඩ පැවැත්මට අවිනිශ්චිතතාවයක් ඇති කළද, එය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | මෙයට හේතුව කොරෝනා වසංගතය සහ එම කාලය තුළ විධායක කමිටුවක් නොමැති වීමයි. කෙසේ වෙතත්, දැන් විධායක කමිටුවක් පත් කර ඇති අතර මෙම තත්ත්වය නිවැරදි කිරීමට පියවර ගෙන තිබේ. | සංගමයේ අඛණ්ඩ පැවැත්ම සහතික කළ යුතු අතර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2024 දෙසැම්බර් 31 දිනට රු.39,561,761 ක්වූ ගෙවිය යුතු ශේෂයෙන් රු.33,137,047 ක් වසර 05 කට වැඩි කාලයක් නිරවුල් කර නොතිබුණි. | මෙය අනාගතයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ | ගෙවිය යුතු මුදල් නිරවුල් කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |

### 1.6.2 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සංගම් 08 කට ලබා දී ඇති මුළු අත්තිකාරම් මුදල වන රු.4,854,036 ක් මෙම වාර්තාවේ දිනය වන විටත් පියවා නොතිබුණි. මෙයින් රු.1,266,258 ක මුදලක් වර්ෂ 05 කට වැඩි කාලයක් පියවා නොතිබුණි. | මෙය අනාගතයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ | අත්තිකාරම් පියවීමට කඩිනම් පියවර ගත යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 16 වන වගන්තිය හා 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් | සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ඊළඟ මාසයේ අවසාන දිනට පෙර ප්‍රේෂණය කළ යුතුය. කෙසේ වෙතත්, 2021, 2022 සහ 2023 වර්ෂ | ඉදිරියේදී එවැනි තත්ත්වයක් ඇතිවීම වැළැක්වීමට කටයුතු කරනු | පනතේ විධිවිධානවලට අනුකූල වීමට පියවර ගත යුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| | පනතේ 16 (1) වන වගන්තිය | සඳහා පිළිවෙලින් රු.380,501, රු.345,400 සහ රු.305,400 ක දායක මුදල් මෙම වාර්තාවේ දිනය වන විටත් ප්‍රේෂණය කර නොතිබුණි. තවද, ශ්‍රී ලංකා රග්බි විසින් නියමිත දිනවලදී සේවක භාර අරමුදලට දායක මුදල් ප්‍රේෂණය කිරීමට අපොහොසත් වී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාලෝචිත වර්ෂය තුළ රු.61,860 ක අධිභාරයක් පනවා තිබුණි. | ලැබේ | |
| (ආ) | 2024 මැයි 03 දිනැති අංක 2382/32 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් පළ කරන ලද 2024 අංක 01 දරන ක්‍රීඩා සංගම් නියෝග III කොටස | | | |
| | (i) 6 (i) වගන්තිය | රටේ සෑම පළාතකම රග්බි ක්‍රීඩාව සංවර්ධනය කිරීම හා ප්‍රවර්ධනය කිරීම පිළිබඳ ඇගයීම සඳහා ප්‍රගති වාර්තාවක් සකස් කර නොතිබුණි. | ඉදිරියේදී මෙම වාර්තා ලබා දීමට කටයුතු කරනු ලැබේ. | ක්‍රීඩා රෙගුලාසි අනුගමනය කළ යුතුය. |
| | (ii) 6 (xii) වගන්තිය | ශ්‍රී ලංකා රග්බි විසින් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණි. | ඉදිරියේදී මෙම වාර්තා ලබා දීමට කටයුතු කරනු ලැබේ. | ක්‍රීඩා රෙගුලාසි අනුගමනය කළ යුතුය. |
| (ඇ) | ජාතික ක්‍රීඩා සංගම්/ සම්මේලනවල කටයුතු සම්බන්ධයෙන් ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල් විසින් 2021 දෙසැම්බර් 15 දින නිකුත් කරන ලද මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| | (i) 3(iii) වගන්තිය | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් අවශ්‍ය අනුමැතිය ලබා නොගෙන ශ්‍රී ලංකා රග්බි විසින් බැංකු ගිණුම් හතරක් (04) පවත්වාගෙන ගොස් තිබුණි. | විධායක කමිටුවේ අනුමැතිය ඇතිව අදාළ ගිණුම් 2025 වර්ෂයේදී වසා දමනු ලැබේ. | මාර්ගෝපදේශ විධිවිධාන අනුගමනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) 3(xiv) වගන්තිය | 2024 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් රු.9,699,681 ක් සහ රු.700,981 ක් වටිනා ස්ථාවර වත්කම් සහ තොග සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | 2025 වර්ෂයේදී මේ සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ. | මාර්ගෝපදේශ විධිවිධාන අනුගමනය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ සංගමයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.12,869,960 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.4,456,249 ක් විය. ඒ අනුව, මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.17,326,209 ක වර්ධනයක් නිරීක්ෂණය විය. පෙර වර්ෂය සමග සැසඳීමේදී, මෙම වර්ධනයට ලෝක රග්බි සංගමයෙන් රු.28,374,202 කින් ලද ප්‍රදාන වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසඳා විශ්ලේෂණය කර වැඩිවීම් හෝ අඩුවීම්වල ප්‍රතිශතයන් සමඟ පහත දැක්වේ.

| විස්තරය | 2024 දෙසැම්බර් 31 දිනට වටිනාකම | 2023 දෙසැම්බර් 31 දිනට වටිනාකම | වෙනස | |
|---|---|---|---|---|
| | | | හිතකර / (අහිතකර) | ප්‍රතිශතය |
| | රු. | රු. | රු. | % |
| **ආදායම්** | | | | |
| අනුග්‍රාහකත්ව ලැබීම් | 38,223,722 | 33,186,014 | 5,037,708 | 15 |
| ලෝක රග්බි ප්‍රදාන | 30,822,013 | 2,447,811 | 28,374,202 | 1159 |
| වෙනත් ආදායම් | 1,410,456 | 808,747 | 601,709 | 74 |
| විදේශ විනිමය ලාභ | 920,435 | 726,543 | 193,892 | 27 |
| **වියදම්** | | | | |
| රග්බි ක්‍රියාකාරකම් වියදම් | 45,265,125 | 29,966,627 | (15,298,498) | 51 |
| පරිපාලන වියදම් | 13,232,681 | 11,528,260 | (1,704,421) | 15 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 8,860 | 130,477 | 121,617 | 93 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.
පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ මුළු ආදායම රු.34,207,511 කින් සහ වියදම රු.16,881,302 කින් ඉහළ ගොස් තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලෝක රග්බි සංගමය විසින් වරින් වර නිකුත් කරන ලද නීති රීති වලට ශ්‍රී ලංකා රග්බි අනුකූල විය යුතු වුවද, ශ්‍රී ලංකා රග්බි එම නීති රීති පිළිපැදීමට අපොහොසත් වී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2017 වර්ෂයේදී ලෝක රග්බි සංගමය විසින් පවුම් 50,000 ක දඩ මුදලක් නියම කර තිබුණි. එයින් පවුම් 40,000 ක් එනම් රු.5,255,621 ක් ලෝක රග්බි සංගමයට ගෙවා තිබුණි. කෙසේ වෙතත්, ඉහත නීති රීති වලට අනුකූල වීමට අපොහොසත් වූ වගකිවයුතු පුද්ගලයින්ට එරෙහිව කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ශ්‍රී ලංකා රග්බි ක්‍රීඩාව ලෝක රග්බි සංගමය විසින් නිකුත් කරන ලද නීති රීති වලට අනුකූල විය යුතුය. |
| (ආ) | 2024 මැයි 29 දිනැති අංක 2386/08 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද නිවේදනයට අනුව ශ්‍රී ලංකා රග්බි ලියාපදිංචිය තාවකාලිකව අත්හිටුවන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, 2024 වර්ෂය තුළ පැවැත්වීමට නියමිතව තිබූ දේශීය ක්‍රීඩා තරඟාවලි 24 ක් සහ ජාත්‍යන්තර තරඟාවලි 04 ක් සැලසුම් කළ පරිදි පැවැත්විය නොහැකි වූ බව නිරීක්ෂණය විය. | එකඟ වෙමි. | ඉදිරියේදී ශ්‍රී ලංකා රග්බි ක්‍රීඩාව අත්හිටුවීම වැළැක්වීමට කටයුතු කළ යුතුය. |